**ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය - 2015**

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2015 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිත සමාගමේ ගිණුම් විගණනය කරන ලද්දේ එහි සාමාජිකයන් විසින් පත්කරන ලද වරලත් ගණකාධිකරණ සමාගමකිනි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය - සමූහය

-----------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය - ආයතනය**

------------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - ආයතනය

----------------------------------------------------

#### 2.2.1 පැහැදිලි නොකල වෙනස්කම්

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හරහා ලබා දී තිබූ සේවක නිවාස ණය ගිණුමේ ශේෂය රු. 33,846,402 ක් වුවත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් එවන ලද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව එදිනට ශේෂය රු. 35,488,831 ක් වූයෙන් රු. 1,642,429 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

නිවාස ණය ලැබීම් හා ගෙවීම් පාලන ගිණුමෙහි පවතින රු. 1,123,432 ක ශේෂයට අදාල විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණයගැති කාලවිශ්ලේෂණයට අනුව 2015 දෙසැම්බර් 31 දිනට සිසුන්ගෙන් අයවිය යුතු වර්ෂ 2 ඉක්මවා තිබූ පාඨමාලා ගාස්තු රු.1,125,187 ක් විය.

(ආ) ණයහිමි ශේෂයතුළ ආයතන 03 කට අදාල වර්ෂ 02 ඉක්මවා තිබූ රු. 1,047,618 ක කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1991 අංක 28 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව(සංශෝධන) පනතේ 7හා 13 වගන්ති | අවම වශයෙන් මාසයකට එක් වරක්වත් පාලක සභා රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණේ රැස්වීම් වාර 07 ක් පමණි. |
| (ආ) 2014 අංක 02 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව(සංශෝධන) පනතේ 02 වගන්තිය | පාලක සභාව සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වුවත් ඉන් එක් සාමාජිකයකු පත්කර නොතිබුණි. තවද, නිලබලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද පාලක සභා රැස්වීම්වලට සහභාගී වී නොතිබුණි. |
| (ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනත | සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී වැටුපට එකතු කරනු ලබන ජීවන වියදම් දීමනාව හා ඒ හා සමාන වෙනත් දීමනාද ඇතුළත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී වැටුපට එකතු කරන ලද රු.10,000 ක අතුරු දීමනාව සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාර අරමුදල් දායකය ගණනය කර නොතිබුණි. |
| (ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 114 වගන්තිය | 2013 හා 2014 වර්ෂවලට අදාල දිරි දීමනා සඳහා, එම දිරිදීමනා ගෙවූ මාසයේ දී එකවර ගෙවීම්වලින් බදු අඩු කිරීම සඳහා අනුප්‍රමාණ බදු චක්‍ර 2කට අදාල කර ගනිමින් උපයන විට ගෙවීම් බදු ගණනය කළ යුතු වුවත්, එම දිරි දීමනාව මාස 12න් බෙදා වෙන වෙනම මාසයට අදාල කර ගනිමින් සාමාන්‍ය බදු චක්‍ර 01 යටතේ උපයන විට ගෙවීම් බදු ගණනය කර තිබුණි. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 ඡේදය | මව් සමාගමේ පාලක සභාව විසින් පරිපාලිත සමාගම්වල කාර්යසාධනය අවම වශයෙන් මාස 06 කට වරක්වත් සාකච්ඡා කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පාලක සභා රැස්වීම් වාර්තාවල කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. |
| (ඊ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06 වන ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාලව රු.මිලියන 48.6 ක අලෙවි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා වූ ඇස්තමේන්තු ගත පිරිවැය වූ ඉක්මවා දරන ලද රු.මිලියන 10.9 ක් වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඊ) 2013 පෙබරවාරි 26 දිනැති අංක 01 /2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ආයතනවල පවත්වනු ලබන සියළුම පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම ලබාගැනීම (NVQ) සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය කළයුතු වුවද එසේ කළ බවට ලිඛිත තහවුරුවක් නොතිබුණු අතර 2015 ජුලි 07 දින සිට 2017 ජුලි 08 දින දක්වා ආයතනය ලියාපදිංචි කිරීම පමණක් සිදුකර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල - සමූහය
-------------------------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ සහ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. 627,678,749 ක් සහ රු.164,200,400 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.313,635,349 ක් සහ රු.159,432,561 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. 314,043,400 කින් හා රු.4,767,839 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බදු ආදායම රු.394,126,433 කින් වර්ධනය වීම සමූහයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර වැටුප් හා දීමනා රු.53,617,151 කින් වැඩිවී තිබුණද ආදායම රු.38,578,774 කින් වැඩිවීම හා ආදායම් බදු වියදම් රු.20,269,877 කින් අඩුවීම ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.246,343,636 ක් වූ ශුද්ධ ලාභය වාර්ෂිකව උච්චාවචනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.164,200,400 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා බදු සැලකීමේදී ආයතනයේ දායකත්වය 2011 ට සාපේක්ෂව 2012 වර්ෂයේදී අඩු වී තිබුණද 2013 වර්ෂයේ සිට 2015 දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

4.1 කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු. 38,578,774 කින් එනම් සියයට 5.6 කින් වැඩිවන විට ඍජු වියදම් රු. 48,983,785 කින් එනම් සියයට 21 කින් වැඩි වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ දළ ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.10,405,011 කින් එනම් සියයට 2.3 කින් අඩු වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේදී සියයට 66.33 ක් වූ දළ ලාභ ප්‍රතිශතය 2015 වර්ෂයේදී සියයට 61.36 දක්වා අඩු වී තිබුණි.

(ආ) 2014 වර්ෂයේ රු. 49,619,890ක් වූ ප්‍රචාරණ වියදම 2015 වර්ෂයේදී රු.59,479,959 ක් වූයෙන් සියයට 19.87 කින් සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරණ වියදමේ වැඩි වීමක් නිරීක්ෂණය වූ අතර ඊට සාපේක්ෂව මුළු පාඨමාලා ආදායමෙහි වර්ධනය සියයට 5.6 ක්වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මහනුවර හා කුරුණෑගල මධ්‍යස්ථාන හැර ප්‍රධාන කාර්යාලය ඇතුළුව අනෙකුත් මධ්‍යස්ථානයන්හි ශිෂ්‍ය සංඛ්‍යාව හා පාඨමාලා සංඛ්‍යාව වැඩි වී තිබුණි. සමස්ථයක් වශයෙන් 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 12 ක් වැඩියෙන් පවත්වා තිබුණු අතර ශිෂ්‍ය සංඛ්‍යාවද 626 කින් වැඩි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම, තත්‍ය කාර්යසාධනය සමඟ සැසඳීමේදී සැලසුම්කළ පරිදි පාඨමාලා 24ක් පවත්වා නොතිබුණු අතර ශිෂ්‍ය සංඛ්‍යාවද 694 කින් අඩුවී තිබුණි.කොළඹ ප්‍රධාන කාර්යාලයේ පාඨමාලා සඳහා සහභාගීවූ ශිෂ්‍ය සංඛ්‍යාව සැලසුම්කර තිබුණු ප්‍රමාණයට වඩා සිසුන් 100 කින් වැඩිවී තිබුණද අනෙකුත් සියළුම ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සහභාගිවූ ශිෂ්‍ය සංඛ්‍යාව සැලසුම්කළ ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි.

(ඉ) ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් නොවුණු කර්මාන්ත ඉංජිනේරු උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් (**Advanced Diploma in Industrial Engineering**) සිසුන් 52 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවත්වා තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්වී නොතිබුණු වෙනත් පාඨමාලා **07**ක් සිසුන් 279 කගේ සහභාගීත්වයෙන් කුරුණෑගල, ගාල්ල හා නුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පවත්වා තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
-----------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ඵලදායී ජීව කාලය අවසන්වී ඇති එහෙත් ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ භාවිතයට ගත නොහැකි පරිගණක හා පරිගණක උපාංග අයිතම 119 ක් (පුස්තකාල පොත් හැර ) 2016 අගෝස්තු 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම් කාලීනව ප්‍රත්‍යාගණනය කර වත්කම්වල සාධාරණ අගය ගිණුම්වල දැක්විය යුතු වුවත් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂයවී තිබුණු පිරිවැය රු.28,711,950 ක් වූ වාහන ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

4.3 ආර්ථික නොවූ ගනුදෙනු
--------------------------

ගිණුම්කරණ කටයුතු සඳහා ආයතනය විසින් ස්ථාපිත කර තිබූ පරිගණක මෘදුකාංගයේ පැවති අඩුපාඩු හේතුවෙන් 2013 වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමකින් තොරව ආයතනයේ තොරතුරු කළමණාකරණ අංශයේ නිර්දේශ මත රු.3,673,410 කට නව පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම මෘදුකාංගයේ සේවා කටයුතු සඳහා රු.1,541,185 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් එම පරිගණක මෘදුකාංගයෙන්ද වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගැනීමට නොහැකිවීම, වැටුප් පිළියෙල කිරීම සඳහා භාවිතා කිරීමට නොහැකිවීම හා ස්ථාවර වත්කම් මොඩියුලය (Fixed Assets Master) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පරිගනක පද්ධතියට ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. තවද නව පරිගණක මෘදුකාංගය ආයතනයට හඳුන්වා දී වසරක් ගත වීමට පෙර හඳුනාගත් ගැටලුකාරී තත්ත්වයන් නිවැරදි කිරීමට එම සමාගම එකඟ නොවූ බැවින් අදාල සේවා ගිවිසුම කඩ කිරීම හේතුවෙන් වෙනත් ආයතනයක සේවය ලබා ගැනීම සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට රු.1,442,824 ක් ගෙවා තිබුණි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම
---------------------------------------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) කොළඹ 07, විද්‍යා මාවතේ අංක 120/5 දරන ස්ථානයේ පිහිටි ඉඩම 2013 ඔක්තෝබර් 17 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නිදහස් ප්‍රදානයක් වශයෙන් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට පවරා දීමට අනුමැතිය ලබාදී තිබුණද ඉඩමේ නීත්‍යානුකූල හිමිකම විගණිත දිනය වූ 2016 සැප්තැම්බර් 30 දිනවන විටත් ආයතනය වෙත ලැබී නොතිබුණි.

(ආ) 2007 නොවැම්බර් 07 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට ගාල්ල නගරයෙහි යෝජිත අධ්‍යාපන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් පවරාදීමට කටයුතු සිදුකර තිබුණද එහි නීත්‍යානුකූල හිමිකම ආයතනයට ලැබී නොතිබුණි. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් මෙම ඉඩම සඳහා ලිඛිත නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමකින් තොරව 2010 මාර්තු 31 දින වන විට රු.302,707,070 ක පිරිවැයක් දරා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර 2015 වර්ෂයේදීද ඒ සඳහා රු.6,685,441ක් වැයකර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය
-------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය 224 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 154 ක් වූයෙන් තනතුරු 70 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු වූ තනතුරු අතර ජ්‍යෙෂ්ඨ උපදේශක, ජ්‍යෙෂ්ඨ දේශක හා දේශක යන තනතුරු 18 ක් සහ නීති නිලධාරී තනතුරද විය. තවද විධායක හා විධායක නොවන මට්ටමේ තනතුරු 28 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) කාර්යාල සහායක තනතුර සඳහා වූ අනුමත කාර්ය මණ්ඩලය 26 ක් වුවද එම ප්‍රමාණය ඉක්මවා කාර්යාල සහායකයින් 07 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------
2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2016 ජුනි 29 දින දීය.

5.2 සංයුක්ත සැලැස්ම
-------------------
2012-2016 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද එය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් 2015 – 2019 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ මෘදුකාංගයේ අඩුපාඩු නිවැරදි කර නොතිබීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | විධිමත් පරිදි වත්කම් පවරා ගෙන නොතිබීම. |
| (ඇ) | මිලදී ගැනීම් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු නොකරන ලද අවස්ථා පැවතීම. |